# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 321/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 22/02/2024 පැය 1650

## මාධ්‍ය නිවේදනය

### යුක්තිය මෙහෙයුමට සමගාමීව ගව සොරකම් මැඩ පැවැත්වීම සඳහා වැඩපිළිවෙලක්

දිවයින පුරා ගවයින් ඇති කරනු ලබන කිරි ගොවීන් විසින් විවිධ අවස්ථාවල ඔවුන්ගේ ගවයින් ගව සොරුන් විසින් සොරකම් කරන බවට පැමිණිලි ඉදිරිපත් වී තිබිණි. මේ පිළිබඳව ඊට අදාල ක්ෂේත්‍ර වල රජයේ නිලධාරීන්ගේද විවිධ ඉල්ලීම් ලැබී තිබූ අතර වැඩබලන පොලිස්පතිතුමා විසින් අදාල සංඛ්‍යා ලේඛණ පරික්ෂා කරමින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ද ඇතුළු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සමඟ සාකච්ඡා පවත්වා මේ පිළිබඳව සොයා බැලීමක් සිදු කරන ලදි.

එහිදී වැඩි වශයෙන් ගව සොරකම් සිදු කරන ප්‍රදේශ ලෙස උතුරු මැද පළාත නිරීක්ෂණය වූ අතර වයඹ සහ දකුණු පළාත් වලද යම් මට්ටමකට ගව සොරකම් සිදු වන බව නිරීක්ෂණය විය. 2023.01.01 වන දින සිට 2024.01.24 වන දින දක්වා උතුරු මැද පළාතේ ගව සොරකම් 336 ක් වාර්තා වී තිබූ අතර ගවයින් 575 කට ආසන්න ප්‍රමාණයක් සොරකම් කර ඇති බව නිරීක්ෂණය විය. පැමිණිලිකරුවන් විසින් නැති වූ ගවයන් පිළිබඳව ඉදිරිපත් කර තිබූ වටිනාකම අනුව එම සොරකම් කරන ලද ගවයින්ගේ වටිනාකම කෝටි 10 ½ ක් ඉක්ම වන බව පෙනී යන ලදී.

සොරකම් කරන ලද ගවයින් සියළු දෙනාම මස් සඳහා භාවිතා වන බව නිරීක්ෂණය වන අතර මෙම තත්ත්වය වැළැක්වීම සඳහා පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් සහ කොට්ඨාස භාර නිලධාරීන්ගේ මූලිකත්වයෙන් බුද්ධි නිලධාරීන්ගේද සහය ඇතිව විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට 2024.02.22 වන අද දින වැඩබලන පොලිස්පතිතුමා නියෝග හා උපදෙස් ලබා දෙන ලදී.

මෙම වැඩපිළිවෙල ප්‍රථමයෙන්ම උතුරුමැද පළාතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන අතර ඉන් අනතුරුව දිවයිනේ අනෙකුත් අවධානය යොමු විය යුතු පළාත් වල ද මෙය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් නුදුරේදීම ක්‍රියාත්මක කරනු ඇත.

යුක්තිය මෙහෙයුම මඟින් මෙවැනි වෙනත් අපරාධ මැඩලීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට ද මේ වන විට අවධානය යොමු කර ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**